# විශ්‍රාන්තිය හා ජන ජීවිතයඃ සියවසක් ඉක්ම වූ සාක්ෂි

ජී.පී. ලිලාන් ලක්ෂිත

ලුයිජි පිරැන්ඩලෝ ක්‍රි ව 1867 සිසිලියෙහි උපත ලැබූහ. කාව්‍ය සංග්‍රහයක් පරිවර්ථනය කරමින් කලා ලෝකයට පිවිසි ඔහු 1893 දී The out cast කෘතිය රචනා කිරීම මුල්ම සාහිත්‍ය වෘක්ෂයේ මල් කැකුළ විය. මෙය ඉන් උපුටා ගත්තකි.

දකුණු දිසාවෙන් ඉහළට නැගුණු කුඩා කඳු ගැටය ඇගේ දර්ශන පථයෙන් දුරස් වී යත්ම මහා සයුරේ අප්‍රමාණ වූ ජලස්කන්ධය ඇගේ දෑස් ඉදිරිපිට විද්‍යාමාන වන්නට විය.ඇගේ සිත මහා ආස්වාදයකින් පිරී ගියේය  අරුණෝදයේ මන්දාලෝකයත් සමගම ඒ පුංචි දෙපා ඉදිරියට ඇවිදගෙන යන්නට විය ගලින් සෑදුනු ඉවුරේ උඩටම නැගගෙන ගිය ඇය ගලක් මත හිඳ ගත්තාය ; පපා කැමිලෝ මිටියාවතදිගේ පහළට බැස යන්නට ගියේය ; ඈ නෙත් යොමා සිටියේ අඳුරට යටවී යන කොළ පාට තැනිතලාව දෙසය ; ගොම්මන් යාමයේ ශාන්ත වූ වර්ණයන් සුවදායක සිහිලක් සදමින්,මිහිකත කරා ළඟා වන ප්‍රසන්න සුවය සමඟ අතිනත ගත්තේය ; මැටි සානුවක පිහිටා තිබුණ ද ඒ ගම්මානය නිල් පාටින් දිලුණේය. පුංචි පුංචි ගෙවල් රාශියක් එක බුරුත්තට එහි ලැග සිටියි. ඔවුන් සිටියේ කන්ද පාමුලය ; මැටි දිය බඳුන් උකුළෙහි දරා ගත් ගැහැනු රංචුව දිය උල්පත ළඟ කථා බහේ යෙදී සිටියහ ;  දොස්තර සිඩෝරෝ ලොපිකෝලෝ ඉතා අගනා ඇඳුම් ඇඳ අලංකාර සිනාවකින් මුව සරසා ගෙන බලා සිටියි ; හුස්ම ගන්නා සුළං පොදට පවා ඔහු සිනහවකින් සංග්‍රහ කළේය ; නෙළී ගායනා කරන්නට පටන් ගත්තේය.කලු සුදු වලා කැරලි අතරින් රන්වන් පුරහඳ පායා ආවේය.හද බැඳි ප්‍රේමය නිසා වරෙක තැවුලින් හා තවත් වරෙක සතුටින් පිරෙන ලූසාගේ වත මඬල මේ පුරහඳමය  එකිනෙකාගේ දෑත්වල වෙළී පැටලී උනුන්ගේ දෙනෙත්දිහා බලාගෙන කියනසෝබර කතා පවා පෙම්වතුන්ගේ සිත්වල දනවන චමත්කාරය අසීමිතය ; කටු කොහොල් පතොක් ගාලෙන් ඔබ්බේ දුහුවිලි නාන පඳුරු අතරින් පතරින් ගලා ආ කුරුලු කූජනයට කොටලුවෝ කන් කෙළින් කොට සවන් දී සිටියහ ; එක් උදෑසනක ඔහු මාගරීටා පාලමෙන් එතෙරවී ගමන් කොට කාසල් මෙඩෝ කෙළවර නිස්කලංක මැඳුරු පිහිටා ඇති අලුත් වීදියකට පිළිපන්නේය ; බලාපොරොත්තු නොවූ මොහොතක එක්තරා මිහිරි කටහඬක් මුදු සුමුදු ආලෝක ධාරාවක් සේ දිවැවිත් ඔහුගේ අඳුරු ලෝකය ප්‍රභාවත් කරන්නට විය ; ඔහුගේ මේ මනෝමය චිත්‍රයට ගැලපෙන අයුරින් සකස් වීමට සිය අඳුරු ලෝකයේ ඔහු විසින් තමා දකින ආකාරයට හැඩ ගැසීමට ඈ කැටපත අසල සිටගෙන බොහෝ සේ උත්සාහ කළාය ; හිදගත්වනම ඔහු දෑත් විහිදා බලා සිටියේ ඇය පිළිගන්නටය ඔහු ඇය සිය සිරුරට තුරුලුකර ගත්තේ ඉතා තදින්ය.උතුරා යන ප්‍රීති ප්‍රමෝදයෙනි  තෙරේසිනා සිසිලියානුගීතයක් සිහින් සරින් ගයමින් සිටියාය ; ඇගේ ස්තුතිවන්ත භාවය හාදු වර්ෂා වී ඔහු තෙමා දැමුවේය.පෙම්වතුන් දෙදෙන සුන්දර සිහින මවමින් සතුටු සයුරේ කිමිදුනහ ; සේවකයාත් ඩොරීනාත් අලංකාර මල් කූඩකිහිපයක් රැගෙන ඇතුළට ආවෝය ; ඔවුහු එකිනෙකා දෙස බැලූහ. එකිනෙකා හා සිනාසුනහ. දෙදෙනා හදුනා ගත්තේ සැබැවින්ම ඒ අවස්ථාවේ මෙනි ; එහෙත් සිනා සිය නග්න උරිස් සලා විසිත්ත කාමරය දෙසට දිව ගියේ සතුටින් කෑගාමින්ය ; පියකරු මලින් හා ආමන්ඩ් අත්තක් ජනේලය දෙසට බර වී තිබුණි.ගෙළයන් මැද තබා තිබුණු බඳුනේ දිය බිඳු සැලෙන රාවයට මුසු වූ ඇත පල්ලියක මංගල්‍යමය සීනු නාදයත් දිළිසෙන හිරු එළිය හා සුවදායක සුළං රැළි වල ආනන්ද ජනක ආස්වාදයෙන් මත්ව ගිය වැහිලිහිණියන්ගේ ගී හඬත් මේ ඈ සියල්ල එකිනෙක කැලැතී මවාලූයේ අමුතුම චමත්කාරයකි ; සිය බෑණා බලන්නට ප්‍රෝලා නෝනා නිතරම පාහේ ආණ්ඩුකාරයාගේ කන්තෝරුවට යන්නීය.එසේ නැත්නම් ඔහු කාර්යාලයේ සිට එන තෙක් මඟ රැකගෙන ඉන්නේ ඔහු හා කඩපලට යන්නය ; හදිසියේ අහම්බෙන් මහමඟ දී හමු වුනොත් ඔවුන් ඉතා සතුටින් එක මඟ යන්නට පටන් ගත්තෝය.ඇය දකුණු පසින් කැඳවාගෙන යන්නට ඔහු අමතක නොකරයි ; ඔහු නිනීව වඩාගෙන ගේවටේම ඇවිදියි ; ටොටී ඉස්කෝලෙ මහත්තයා දෑස් අඩවන් කොට සිනාසී අතක් ඔසවා සිය පපුවට ඇඟිලිතුඩින් තට්ටු කළේය ; චාම් සාලයට ඇතුලු වූ ඉස්කෝලෙ මහත්තයා අසුන් ගෙන නිනී දෙදණ මැද හිදුවා ගත්තේය ;

රාජපක්ෂ ස්වර්ණ කාන්ති, (2003),කුරුල්ලා හා තරු මඬල(ලුයිජි පිරැන්ඩෙලෝ ගේ කෙටිකතා), සීමාසහිත දීපානි, 464. හයිලෙවල් පාර,ගංගොඩවිල,නුගේගොඩ.